00027

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**අධ්‍යාපන පීඨය**

**අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංග කලා) උපාධි වැඩසටහන - පස්වන මට්ටම 2014/2015**

**අවසාන පරීක්ෂණය - 2016**

**අධ්‍යාපනයේ පදනම – ESU3226**

**කාලය : පැය (03) තුනයි.**

---

**දිනය - 2016 අප්‍රේල් 05** **වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා**

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## <u>1 වන කොටස</u>

01. අධ්‍යාපන සංකල්පය විස්තර කිරීමට අපහසු වීමට හේතු දෙකක් (02) දක්වන්න.

02. "ළමයාගේ අධ්‍යාපනය ඔහුගේ හැකියාවන් අවශ්‍යතාවන් හා ලැදියාවන්ට අනුකූලව ලබා දිය යුතුය." මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? හේතු තුනක් (03) දෙන්න.

03. අධ්‍යාපන දර්ශනයේ විවිධ එළඹුම් දෙකක් (02) නම් කරන්න.

04. සාරධර්මවල කාර්යයන් තුනක් (03) නම් කරන්න.

05. අධ්‍යාපන පරමාර්ථ යනු කුමක්දැයි දක්වා එහි මූලික බෙදීම් දෙක පැහැදිලි කරන්න.

06. "ප්‍රාථමික සමාජානුයෝජනය" යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? කෙටියෙන් පැහැදිලි කරන්න.

07. "සමාජ ස්තරායනය" යන සංකල්පය සැකෙවින් පැහැදිලි කරන්න.

08. සංවර්ධනය වෙමින් පවතින රටවල සංවර්ධනය සඳහා කටයුතු කිරීමේදී අධ්‍යාපනයට පැවරෙන වගකීම් තුනක් (03) සඳහන් කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) සාමාන්‍ය දර්ශනය හා අධ්‍යාපන දර්ශනය අතර සම්බන්ධය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) අධ්‍යාපන දර්ශනය ගුරුවරයාට ප්‍රයෝජනවත් වන්නේ කෙසේද? නිදසුන් මගින් සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

10. (i) සදාචාරය සහ විනය අතර සම්බන්ධතාව නිදසුන් දෙකක් (02) ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) සිසුන් තුළ සාරධර්ම වැඩිදියුණු කිරීම සඳහා ගුරුවරයාට ගත හැකි විවිධ ක්‍රම ශිල්ප විභාග කරන්න. (ලකුණු 10)

11. (i) සමාජය යනු කුමක්දැයි දක්වා සමාජ වෙනස්වීම පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) සමාජවෙනස්කම් සිදුවන විට අධ්‍යාපන පරමාර්ථ ද ඒ අනුව වෙනස්වීම වැදගත් වන්නේ ඇයි? විභාග කරන්න. (ලකුණු 10)

12. (i) සමාජානුයෝජනය යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) සමාජානුයෝගී කාරකයක් ලෙස පවුලේ බලපෑම අගයන්න. (ලකුණු 10)

13. (i) ආර්ථික සංවර්ධනය සහ පූර්ණ සංවර්ධනය අතර ඇති වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ii) අධ්‍යාපනය ආයෝජනයක් ලෙසඑ යොදා ගැනීමේදී සංවර්ධනය වෙමින් පවතින රටවල් මුහුණ දෙන අභියෝග හතරක් (04) සාකච්ඡා කරන්න. (ලකුණු 10)

14. පහත දැක්වෙන ඕනෑම මාතෘකා දෙකක් (02) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) මහත්මා ගාන්ධිතුමාගේ අධ්‍යාපන යෝජනා
(ii) සමාජ පංතිය සහ අධ්‍යාපනය
(iii) ළමුන් සමාජානුයෝගී වීමේදී ජනමාධ්‍යවල බලපෑම
(iv) යාවජීව අධ්‍යාපනයේ අධ්‍යාපනයේ වර්තමාන දායකත්වය

(ලකුණු 10 x 2 = 20)

හිමිකම් ඇවිරිණි.